# අධ්‍යාපනික දර්ශනය ගුරුවරයාට වැදගත් වන ආකාරය

**සඳමාලි උදේශිකා දිසානායක**

අධ්‍යාපනය යනු කිසිම සමාජයක නොමැකෙන අංගයකි. එය පුද්ගලයාගේ මනස, හැසිරීම් හා දැනුම පෝෂණය කිරීමෙන් පමණක් නොව සමාජ වෙනස්වීම්, සන්නිවේදන ක්‍රම, ආර්ථික පද්ධති සහ සංස්කෘතික වටිනාකම් වර්ධනය කිරීමේදී ද මහත් භූමිකාවක් ඉටු කරයි. විශේෂයෙන්ම නූතන සමාජය හැඩගැස්වීමේදී අධ්‍යාපන වටිනාකම වැඩි වශයෙන් වැදගත් වේ. “අධ්‍යාපනය” යන වචනය විශේෂඥයන් විවිධාකාරයෙන් අර්ථකථනය කර ඇත. භාෂා විද්‍යාවට (Etymological) අනුව, අධ්‍යාපනය (Education) යන්න (Educare, Educo, Educatum) යන ලතින් වචනවලින් සකස් වී ඇත. මෙම ලතින් වචනවලින් ගම්‍ය වන්නේ ඉවතට යැම (To lead out) නැතහොත් පිටතට මතු කර දීම යන්නයි. Educere - මඟ පෙන්වීම හෝ එළියට ගැනීම, Educare - ඇති දැඩි කිරීම සහ සාරය එළියට ගැනීම, Educo - ඉදිරියට යොමු කිරීමල Education - ඉගැන්වීමේ ක්‍රියාවලිය Education යන වචනයේ නිරුක්ති සහිත අදහස ලෙස දැක්විය හැකි බව (Oxford Dictionary, 2023) දක්වයි.

අධ්‍යාපනය මිනිසාගේ කායික, මානසික, සමාජීය, සංස්කෘතික, සදාචාරත්මක, අධ්‍යාත්මික වශයෙන් සහජ ශක්තීන් නොනවත්වා වර්ධනය කරන්නා වූ නිත්‍ය ක්‍රියාවලියකි. අධ්‍යාපනය යනු ඉතා සංකීර්ණ සංකල්පයක් ලෙසත් අතීතයේ සිට මේ දක්වා මිනිසා අධ්‍යාපන ක්‍රියාවලියක නිරතව සිටින බවත් හඳුනාගත හැකිය. අධ්‍යාපනය මඟින් පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියක් යන්න හඳුනාගත හැකිය. අධ්‍යාපනයේ අරමුණු විවිධ ය. අධ්‍යාපනය තුළින් බලාපොරොත්තු වන්නේ පුද්ගලයාගේ දැනුම (Knowledge), ආකල්ප (Attitude), කුසලතා (Skills) වර්ධනය කිරීමයි. එසේ නොවේ නම් හිස (Head), අත (Hand), හදවත (Heart) සංවර්ධනය කිරීමයි. පෙරදිග සහ අපරදිග නිර්වචනවලට අනුව, ඉන් බලාපොරොත්තු වන්නේ යාවජීව ක්‍රියාවලියකි. නැතහොත් උපතේ

සිට මරණ දක්වා දිවි ඇති තෙක් ඉගෙනීම ය. අධ්‍යාපන දර්ශනය (Philosophy of Education) යනු අධ්‍යාපනයෙහි පදනම පිළිබඳ විමසුමකි. මෙය අධ්‍යාපනයේ අරමුණු, අන්තර්ගතය, ක්‍රමවේදය, ගුරු-ශිෂ්‍ය සම්බන්ධය, විනය හා සමාජය සමඟ අධ්‍යාපනයෙහි සබඳතාවය වැනි කරුණු පිළිබඳව විචාරාත්මකව සෙවීමකි. විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීමේ උපාය මාර්ග, පන්ති කාමර කළමනාකරණය සහ ශිෂ්‍ය ඇගයීම පිළිබඳ තීරණ ගැනීමේදී අධ්‍යාපනඥයින් සඳහා මාර්ගෝපදේශක රාමුවක් ලෙස අධ්‍යාපනික දර්ශනය සේවය කරන බව Ornstein & Hunkins (2017) දක්වා ඇත.

එසේ ම එය ඥානවිද්‍යාව (දැනුම පිළිබඳ න්‍යාය), ආචාර ධර්ම, පාරභෞතික විද්‍යාව සහ තර්කනය වැනි ප්‍රධාන දාර්ශනික සංකල්ප අධ්‍යාපනික න්‍යාය සහ භාවිතය සමඟ ඒකාබද්ධ කරයි, යනුවෙන් Noddings (2012) විසින් ද ප්‍රකාශ කර ඇත.

මෙම අධ්‍යාපන දර්ශනයේ ස්වභාවය, පුද්ගල හා සමාජ සංවර්ධනය කෙරෙහි බලපෑම අවබෝධ කර ගැනීම සඳහා තීරණාත්මක පදනමක් සැපයීමයි. එය වටිනාකම් මත පදනම් වූ අධ්‍යාපනය, චරිතය වර්ධනය කිරීම, සමාජ වගකීම සහ බුද්ධිමය වර්ධනය ගවේෂණය කරන බව Dewey (1938) පවසයි. අධ්‍යාපනික දර්ශනය, දැනුම සම්ප්‍රේෂකයෙකු ලෙස පමණක් නොව, ජීවිත කාලය පුරාම ඉගෙනීමේ උපදේශකයෙකු, මඟ පෙන්වන්නෙකු සහ පහසුකම් සපයන්නෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාව නිර්වචනය කිරීමට ද උපකාරී වන බව ෆ්‍රයර් (1996) විසින් පවසයි. නූතන කාලයේ ගෝලීයකරණය, බහු සංස්කෘතිකවාදය, තාක්ෂණික ඒකාබද්ධතාවය, සදාචාරාත්මක පරිහානිය සහ මානසික සෞඛ්‍යය වැනි සමකාලීන අධ්‍යාපනික අභියෝග ආමන්ත්‍රණය කිරීමේදී අධ්‍යාපනික දර්ශනය අත්‍යවශ්‍ය වන බව ගිරෝ (2012) විසින් දක්වා ඇත. එය ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම, ඇතුළත් අධ්‍යාපනය සහ ඉගෙනගන්නන්ගේ සමස්ත සංවර්ධනය ප්‍රවර්ධනය කරන බව නෝඩින්ග්ස් (2005) විසින් දක්වයි.

අධ්‍යාපනික දර්ශනයේ ප්‍රධාන පැතිකඩ කිහිපයක් හඳුන්වා කිහිපයක් ඇත. ඒවා අතර මනස සහ සදාචාරාත්මක වටිනාකම් වර්ධනය අවධාරණය කරන පරමාදර්ශවාදය බව නයිට් (2006) පෙන්වා

දී ඇති අතර භෞතික ලෝකය සහ විද්‍යාත්මක දැනුම කෙරෙහි අවධානය යොමු කරන යථාර්ථවාදය බව ඔස්මන් සහ ක්‍රේවර් (2011) පෙන්වා දී ඇත. අත්දැකීම් සහ ගැටලු විසඳීම තුළින් ඉගෙනීම දිරිමත් කරන ප්‍රායෝගිකවාදය බව ඩිවි (1938) පෙන්වා දී ඇති අතර (මොරිස්, 1966) පවසන්නේ පුද්ගලික තේරීම, නිදහස සහ පෞද්ගලිකත්වයට සහාය වන පැවැත්මවාදය අධ්‍යාපන දර්ශනයේ ප්‍රධාන පැතිකඩයන් බවයි. සිහිය, සදාචාරාත්මක හැසිරීම, අනුකම්පාව සහ අධ්‍යාත්මික සංවර්ධනය ඉස්මතු කරන බෞද්ධ අධ්‍යාපනික දර්ශනයෙහි ප්‍රධාන සම්ප්‍රදායන් බව ගුණසේකර (2003) විසින් පවසා ඇත.

**අධ්‍යාපන දර්ශනයේ ප්‍රායෝගික උපයෝගීතාව**

**01. ගුරුවරුන් සඳහා**

අධ්‍යාපන දර්ශනය ගුරුවරුන්ට අධ්‍යාපනය, විෂයමාලා සහ පන්ති කාමර පිළිබඳව කල්පනාකාරී තීරණ ගැනීමට සහාය වේ. එහිදී ගුරුවරුන් ඔවුන්ගේ ඉලක්ක, වටිනාකම් සහ ඉගැන්වීමේ විලාසයන් විවේචනාත්මකව ඇගයීමට ලක් කෙරෙන බව බෲක්ෆීල්ඩ් (1995) විසින් දක්වා ඇත. උදාහරණයක් ලෙස, ගුරුවරයෙකු කටපාඩම් කිරීමට වඩා ක්‍රියාකාරී ඉගෙනීම සහ ගැටලු විසඳීම අවධාරණය කළ හැකිය.

අධ්‍යාපන දර්ශනය තුළ පදනම් වූ ගුරුවරු ඔවුන්ගේ ක්‍රියාවන් පිළිබඳව වඩාත් ගැඹුරින් සොයාබැලීම සහ වඩා හොඳ ප්‍රතිඵල ලබාදීම සඳහා උපාය මාර්ග සකස් කිරීමට නැඹුරු වෙති. අධ්‍යාපන දර්ශනය මඟින් ගුරුවරුන්ට සදාචාරාත්මක තීරණ ගැනීමට සහාය වේ. ගුරු අනන්‍යතාවය සහ අරමුණ වැඩි දියුණු කරන අතර ම අධ්‍යාපනික අරමුණු සමඟ ඉගැන්වීමේ ක්‍රම පෙළගස්වයි. සංස්කෘතික වශයෙන් ප්‍රතිචාරාත්මක පන්ති කාමර ගොඩනඟයි. චිත්තවේගීය බුද්ධිය සහ අනුකම්පාව ප්‍රවර්ධනය කරයි. මේ එකින් එක පිළිබඳ පැහැදිලි කිරීම පහත පරිදි දැක්විය හැකිය.

**සදාචාරාත්මක තීරණ ගැනීමට සහාය වීම**

ගුරුවරු බොහෝවිට පන්ති කාමරය තුළ සදාචාරාත්මක සහ සදාචාරාත්මක නොවන උභතෝකෝටික ගැටලුවලට මුහුණ දෙති.

සාධාරණත්වය සහ විනය පිළිබඳ ගැටලු වැනි අධ්‍යාපනික දර්ශනයේ ආචාර ධර්ම පිළිබඳ අවබෝධය ඔවුන්ට මෙම තත්වයන් විසඳීමට උපකාරී වන බව නෝඩින්ග්ස් (2005) විසින් දක්වයි. උදාහරණයක් ලෙස ආචාර ධර්ම මගින් මෙහෙයවනු ලබන ගුරුවරයෙකු සිසුන් සමඟ සන්නිවේදනය සබඳතා ගොඩනැගීම ඉතා යහපත් අයුරින් සිදුකරයි.

**අධ්‍යාපනික අරමුණු සමඟ ඉගැන්වීමේ ක්‍රම පෙළගස්සවීම**

සෑම අධ්‍යාපනික දර්ශනයක්ම ඇතැම් ඉගැන්වීමේ ක්‍රම පිළිබිඹු කරයි. ප්‍රගතිවාදය ව්‍යාපෘති පාදක ඉගෙනීම සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කරන බව ඩිවි (1938) දක්වයි. බහු වාර්ෂිකවාදය කල් පවතින සත්‍යයන් සහ සම්භාව්‍ය ග්‍රන්ථ කෙරෙහි අවධානය යොමු කරයි. නිර්මාණාත්මකවාදය සිසුන් විසින් මෙහෙයවනු ලබන විමර්ශනය සහ කිරීමෙන් ඉගෙනීම දිරිමත් කරන බව පියජේට් (1972); වයිගොට්ස්කි, (1978) දක්වා ඇත. දර්ශනය සමඟ අධ්‍යාපනය පෙළගස්වා ගැනීමෙන්, ගුරුවරුන් ඔවුන්ගේ ඉගැන්වීමේ ප්‍රවේශයේ අනුකූලතාව සහ පැහැදිලිකම පවත්වා ගෙන ඇත.

**සංස්කෘතික වශයෙන් ප්‍රතිචාරාත්මක පන්ති කාමර ගොඩනඟයි**

විවිධ සමාජවල, ගුරුවරුන් සිසුන්ගේ සංස්කෘතික පසුබිම් ආමන්ත්‍රණය කළ යුතුය. අධ්‍යාපනික දර්ශනය සංස්කෘතික වශයෙන් ප්‍රතිචාරාත්මක අධ්‍යාපනික විද්‍යාවේ වර්ධනයට සහාය වේ. සිසුන්ගේ අනන්‍යතා, භාෂා සහ සම්ප්‍රදායන් අගය කරන ඉගැන්වීම වේ. මෙය ශ්‍රී ලංකාව වැනි බහුභාෂා සහ බහු වාර්ගික රටවලට විශේෂයෙන් අදාළ වේ.

**චිත්තවේගීය බුද්ධිය සහ අනුකම්පාව ප්‍රවර්ධනය කිරීම**

බෞද්ධ අධ්‍යාපනික චින්තනය ඉගැන්වීමේ අත්‍යවශ්‍ය අංග ලෙස අනුකම්පාව (කරුණා) සහ සිහිකල්පනාව (සති) වගා කිරීම ඉස්මතු කරයි. එවැනි දර්ශන මගින් දැනුවත් කරන ලද ගුරුවරුන් චිත්තවේගීය වශයෙන් ආරක්ෂිත සහ සාමකාමී ඉගෙනුම් පරිසරයන් නිර්මාණය කරයි. එය සිසුන්ගේ යහපැවැත්මට ප්‍රයෝජනවත් වේ (ගුණරතන, 2011).

## 2. විෂයමාලා සංවර්ධනය සඳහා

විෂයමාලාව අධ්‍යාපන දාර්ශනික විශ්වාසයන් මගින් හැඩගස්වා ඇත. පරමාදර්ශවාදය අනුගමනය කරන ගුරුවරයෙකු හෝ අධ්‍යාපන ක්‍රමයක් සාහිත්‍යය, සදාචාරාත්මක අධ්‍යාපනය සහ මානවශාස්ත්‍ර පිළිබඳවත් යථාර්ථවාදය සහ නිරීක්ෂණය යන කරුණුවලටත් ප්‍රමුඛත්වය දිය හැකි බව නයිට් (2006) දක්වා ඇත.

බෞද්ධ අධ්‍යාපනික දර්ශනය, ප්‍රඥාව (පඤ්ඤා), සදාචාරය (සීල) සහ මානසික විනය (සමාධි) තුළ මුල් බැස ඇති අතර අධ්‍යාත්මික, සදාචාරාත්මක සහ බුද්ධිමය වර්ධනය ඒකාබද්ධ කිරීමට උත්සුක වේ යන්න ගුණසේකර (2003) දක්වා ඇත.

### පරමාදර්ශවාදය සහ විෂයමාලාව

පරමාදර්ශවාදය තුළින් සාහිත්‍යය, ඉතිහාසය, ආචාර ධර්ම සහ දර්ශනය වැනි බුද්ධිමය හා සදාචාරාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කරන විෂයයන් පිළිබඳ අවධාරණය කරයි. ස්වයං අවබෝධය, සත්‍යය සහ ගුණධර්ම කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන්ගේ අභ්‍යන්තර ලෝකය පෝෂණය කිරීමට විෂයමාලාව උත්සාහ කරන බව නයිට් (2006) දක්වයි. "අධ්‍යාපනයේ ඉහළම අරමුණ සදාකාලික සත්‍යයන් සොයා ගැනීම සහ මනස වගා කිරීම'' බෞද්ධ අධ්‍යාපනයේ සදාචාරාත්මක බව කෙරෙහි අවධානය යොමු කිරීම අවධාරණය කෙරේ.

### යථාර්ථවාදය සහ විෂයමාලාව

යථාර්ථවාදීන් විශ්වාස කරන්නේ දැනුම බාහිර ලෝකයෙන් ලබාගන්නා බවත් ඉන්ද්‍රියන් හරහා සත්‍යාපනය කළ හැකි බවත්ය. මේ අනුව විෂයමාලාව ව්‍යුහගත, වෛෂයික සහ ආනුභවික දැනුම මත පදනම් වී ඇති අතර විද්‍යාව, ගණිතය සහ තාක්ෂණය පිළිබඳ අවධාරණය කරයි. යථාර්ථවාදය විනය සහ සත්‍ය නිරවද්‍යතාවය ප්‍රවර්ධනය කරන අතර ම ජීවිතයේ ප්‍රායෝගික ඉල්ලීම් සඳහා සිසුන් සූදානම් කිරීම අරමුණු කරන බව Ozmon & Craver (2011) දක්වා ඇත.

### ප්‍රායෝගිකවාදය සහ විෂයමාලාව

ජෝන් ඩිවිගේ බලපෑමට ලක් වූ ප්‍රායෝගිකවාදය, අධ්‍යාපනය සමාජීය සහ අත්දැකීම් සහිත ක්‍රියාවලියක් ලෙස දකී. එය ගැටලු විසඳීම, ව්‍යාපෘති පාදක ඉගෙනීම සහ සැබෑ ජීවිත යෙදුම් පිළිබඳ අවධාරණය කරයි. විෂයමාලාව නම්‍යශීලී, ශිෂ්‍ය කේන්ද්‍රීය වන අතර වෙනස්වන සමාජයකට අනුවර්තනය වීමට ඉගෙන ගන්නන් සූදානම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බව ඩිවි (1938) විසින් පෙන්වා දෙයි. "අධ්‍යාපනය යනු ජීවිතයම මිස ජීවිතය සඳහා සූදානමක් නොවේ." යන්න ඩිවි විසින් වරෙක නිර්වචන ද කොට ඇත.

### පැවැත්ම සහ විෂයමාලාව

පැවැත්මේ දර්ශනය පුද්ගල නිදහස, තේරීම සහ අව්‍යාජභාවය අගය කරයි. මෙම දර්ශනය මගින් හැඩගස්වන ලද විෂයමාලාවක් පුද්ගලීකරණය කර ඇති අතර, සිසුන්ට ඔවුන්ගේ අනන්‍යතාවය සහ අරමුණ ගවේෂණය කිරීමට දිරිගන්වයි. සාහිත්‍යය, කලාව සහ දර්ශනය වැනි නිර්මාණාත්මක විෂයයන් ශිෂ්‍ය හඬ සහ නියෝජිතභාවය කෙරෙහි අවධාරණය කරමින් කේන්ද්‍රීය වන බව මොරිස් (1966) දක්වයි.

### ප්‍රතිසංස්කරණවාදය සහ විෂයමාලාව

සමාජ ප්‍රතිසංස්කරණවාදීහු අධ්‍යාපනය සමාජය පරිවර්තනය කිරීමේ මෙවලමක් ලෙස දකිති. විෂයමාලාව සමාජ සාධාරණත්වය, අසමානතාවය සහ ගෝලීය පුරවැසිභාවය කෙරෙහි ඔවුහු ආමන්ත්‍රණය කරති. සිවිල් අධ්‍යාපනය, පාරිසරික අධ්‍යයනය, සාම අධ්‍යාපනය සහ විවේචනාත්මක චින්තනය වැනි විෂයයන් පිළිබඳ අවධාරණය කෙරෙන බව බ්‍රමල්ඩ් (1971) විසින් පෙන්වා දී ඇත.

### බෞද්ධ අධ්‍යාපනික දර්ශනය සහ විෂයමාලාව

බෞද්ධ අධ්‍යාපනික චින්තනය පහත සඳහන් කරුණු මුල් කරගත් වටිනාකම් මත පදනම් වූ විෂයමාලාවක් යෝජනා කරයි.

- පඤ්ඤා (ප්‍රඥාව) - විවේචනාත්මක චින්තනය, තීක්ෂණ බුද්ධිය සහ යථාර්ථය පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම
- සීල (සදාචාරය) - අනුකම්පාව, අවංකභාවය සහ විනය වැනි සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීම
- සමාධි (මානසික විනය) - සිහිය, අවධානය සහ අභ්‍යන්තර සාමය වගා කිරීම

මෙම ත්‍රිශික්ෂාවන් පුහුණුව බුද්ධිමය, අධ්‍යාත්මික, චිත්තවේගීය සහ සමාජ වර්ධනය මිශ්‍ර කරමින් සමස්ත සංවර්ධනය දිරිමත් කරන බව ගුණසේකර (2003; කළුපහන (1991) ආදීහු දක්වති. එවැනි විෂයමාලාවක් සාමකාමී, සදාචාරාත්මක සහ සමාජීය වශයෙන් වගකිව යුතු පුද්ගලයින් නිර්මාණය කරයි. ශ්‍රී ලංකාව වැනි රටවල, බෞද්ධ මූලධර්ම ඓතිහාසිකව ජාතික විෂයමාලාව හැඩගස්වා ඇති අතර සදාචාරාත්මක අධ්‍යාපනය, භාවනා පිළිවෙත් සහ අන්තර්පුද්ගල සහජීවනය පිළිබඳව අවධාරණය කරන බව සිල්වා (2008) දක්වයි.

## 3. නූතනයට වැදගත් වන ආකාරය

21 වන සියවසේදී අධ්‍යාපනය තාක්ෂණය, ගෝලීයකරණය සහ බහු සංස්කෘතිකවාදය මගින් මෙහෙයවනු ලබන වේගයෙන් වෙනස් වන ලෝකයකට අනුගත විය යුතුය. අධ්‍යාපනික දර්ශනය මෙම අභියෝගවලට ඇතුළත්, සදාචාරාත්මක සහ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම් ආමන්ත්‍රණය කරයි. උදාහරණයක් ලෙස, පාවුලෝ ෆ්‍රෙයර්ගේ කෘති මත පදනම් වූ විවේචනාත්මක අධ්‍යාපනය, ඉගෙන ගන්නන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ සමාජීය වශයෙන් සවිඥානික සහ ක්‍රියාශීලී සහභාගිවන්නන් වීමට උද්යෝගීමත් කරන බව ෆ්‍රෙයාර් (1996) විසින් පෙන්වා දී ඇත.

## 4. ජාතික සහ ගෝලීය සංවර්ධනය සඳහා

රටක අධ්‍යාපන ක්‍රමය එහි සංස්කෘතික හා දාර්ශනික වටිනාකම් පිළිබිඹු කරයි. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන මූලධර්ම ඓතිහාසිකව අවධාරණය කර ඇත්තේ මානසික පාරිශුද්ධත්වය, අනුකම්පාව, ප්‍රඥාව සහ විනය වැනි බෞද්ධ

ඉගැන්වීම් කෙරෙහි වේ. වත්මන් තරඟකාරී ලෝකයේ සමබර පුරවැසියන් ගොඩනැගීමේදී එම ඉගැන්වීම් අදටත් ඉතා අදාළ වේ. ඕනෑම ජාතියක සංවර්ධනය ආර්ථික ශක්තිය මත පමණක් නොව එහි අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය මත රඳා පවතී. පුරවැසියන්ගේ චරිතය, වටිනාකම් සහ හැසිරීම හැඩගැස්වීමේදී අධ්‍යාපන දර්ශනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යාපනය පිළිබඳ ශක්තිමත් ජාතික දර්ශනයක සාමය, වගකීම, විනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කරන බව ඕර්න්ස්ටයින් සහ හන්කින්ස් (2017) දී පෙන්වා දී ඇත.

**ජාතිය ගොඩනැගීමේ කාර්යභාරය**

මානවවාදී සහ සදාචාරාත්මක දර්ශන අනුගමනය කරන රටවල් සැලකිලිමත්, සදාචාරාත්මක සහ සමාජීය වශයෙන් වගකිව යුතු පුරවැසියන් බිහි කිරීමට නැඹුරු වේ. මෙම දර්ශන ජීවිතයට ගරු කිරීම, සමාජ සාධාරණත්වය, සමානාත්මතාවය සහ ගෝලීය සහයෝගීතාවය උගන්වන අතර, මේ සියල්ල දිගුකාලීන සංවර්ධනය සහ සමගිය සඳහා අත්‍යවශ්‍ය වන බව නෝඩින්ග්ස් (2012) දක්වයි. උදාහරණයක් ලෙස, ෆින්ලන්තය එහි අධ්‍යාපන දර්ශනය තුළ සමානාත්මතාවය, විශ්වාසය සහ ශිෂ්‍ය යහපැවැත්ම අවධාරණය කරන අතර එය ගෝලීය අධ්‍යාපන ශ්‍රේණිගත කිරීම්වල සාර්ථකත්වයට දායක වී ඇත.

ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික සම්ප්‍රදාය තුළ පඤ්ඤා (ප්‍රඥාව), සීල (සදාචාරය) සහ සමාධි (මානසික විනය) වැනි බෞද්ධ අධ්‍යාපනික වටිනාකම් ඓතිහාසිකව සාමකාමී සහ විනයගරුක සමාජ හැඩගස්වා ඇත. පුරාණ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ආගමික දැනුම පමණක් නොව සිවිල් අධ්‍යාපනය, නායකත්වය සහ ආචාර ධර්ම ද ප්‍රවර්ධනය කොට ඇති බව සිල්වා (2008) පෙන්වා දී ඇත.

**ගෝලීය වැදගත්කම**

අසමානතාවය සහ ගැටුම්වලට මුහුණ දෙන ගෝලීයකරණය වූ ලෝකයක, අධ්‍යාපන දර්ශනය ගෝලීය පුරවැසිභාවය සහ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. යුනෙස්කෝව සාමය, ගෞරවය, විවිධත්වය සහ පාරිසරික රැකවරණය මත පදනම්

වූ අධ්‍යාපන ආකෘතියක් ප්‍රවර්ධනය කරයි. බෞද්ධ සහ දේශීය ලෝක දර්ශන සමඟ සමීපව සම්බන්ධ වන ඉලක්ක ජය ගැනීම ගෝලීය වශයෙන් වැදගත් බව UNESCO (2015) වාර්තාවෙන් හෙළිවේ.

උදාහරණයක් ලෙසඃ

- පාසල්වල ආතතිය සහ ආක්‍රමණ කළමනාකරණය කිරීමට සිහිකල්පනාව උපකාරී වේ.
- විවිධ පන්ති කාමරවල ඉගෙනුම් සඳහා අනුකම්පාව උපකාරී වන අතර සංවේදනය ගොඩනඟයි.
- අවිහිංසාව (අහිංසනය) සාමකාමී සමාජ සහ අන්තර් සංස්කෘතික සමගිය සඳහා සහාය වේ.
- විවිධත්වය තුළ ඒකීයභාවය ප්‍රවර්ධනය කිරීම

සංස්කෘතික විවිධත්වයට ගරු කරන අධ්‍යාපනික දර්ශන ජාතීන්ට වාර්ගික ගැටුම් වළක්වා ගැනීමට සහ ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වේ. ශ්‍රී ලංකාවේ බහු-වාර්ගික සමාජය තුළ, බහුත්වවාදී සහ බෞද්ධ මානවවාදී වටිනාකම් මගින් මෙහෙයවනු ලබන ඇතුළත් අධ්‍යාපනයට වාර්ගික හා ආගමික කණ්ඩායම් අතර පාලම් ගොඩනගා ගත හැකිය.

**උසස් අධ්‍යාපනය සහ පර්යේෂණවලදී අධ්‍යාපන දර්ශනයේ කාර්යභාරය**

විශ්වවිද්‍යාල මට්ටමින්, අධ්‍යාපනික දර්ශනය අධ්‍යයන නිදහස, පර්යේෂණ ආචාර ධර්ම සහ අන්තර් විෂය ඉගෙනීම හැඩගැස්වීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන බව සඳහන් කළ හැකිය. එය ජීවිත කාලය පුරාම ඉගෙනීම, විමසීම සහ පර්යේෂණ අඛණ්ඩතාව ප්‍රවර්ධනය කරයි. එය විද්වතුන් උපකල්පනවලට අභියෝග කිරීමට, සම්මතයන් ප්‍රශ්න කිරීමට සහ නව දැනුම දායක කිරීමට දිරිමත් කරන පරිසරයක් පෝෂණය කරයි.

මානසික සෞඛ්‍යය, පාරිසරික හායනය සහ අසමානතාවය වැනි සංකීර්ණ ගෝලීය ගැටලු විසඳීමේදී අත්‍යවශ්‍ය වන අන්තර්

විෂය පර්යේෂණ ද දාර්ශනික පදනම් දිරිමත් කරන බව Ozmon & Craver (2011) දක්වා ඇත. උදාහරණයක් ලෙස, බෞද්ධ දර්ශනය, මනෝවිද්‍යාව සහ අධ්‍යාපනය සමඟ ඒකාබද්ධ කිරීම සිහිකල්පනාව මත පදනම් වූ ප්‍රතිකාර, ආචාර ධර්ම සහ අධ්‍යාපනික යහපැවැත්ම පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙයි. ජීවිත කාලය පුරාම ඉගෙනීමේ දර්ශනයක් අනුගමනය කරන විශ්වවිද්‍යාල උපාධියෙන් ඔබ්බට සිසුන්ගේ බුද්ධිමය හා සදාචාරාත්මක සංවර්ධනයට සහාය වේ. ප්‍රඥාව වගා කිරීම ප්‍රවර්ධනය කරයි. එය බෞද්ධ චින්තනය සමඟ සමීපව පෙළ ගැසේ.

**නිගමනය**

අධ්‍යාපන දර්ශනය යනු හුදෙක් න්‍යායික විෂයයක් නොවේ. එය සාම්ප්‍රදායික සහ නූතන සන්දර්භ දෙකෙහිම අධ්‍යාපනයේ අරමුණ, ක්‍රියාවලිය සහ ප්‍රතිඵල හැඩගස්වන ප්‍රායෝගික සහ ගතික මාර්ගෝපදේශයකි. එය ගුරුවරුන්ට ප්‍රත්‍යාවර්ථක (Reflective) වෘත්තිකයන් වීමට බලය ලබා දෙයි. සදාචාරාත්මක, බුද්ධිමය සහ සංස්කෘතික වටිනාකම් ඇතුළත් කිරීමෙන් විෂයමාලාවට බලපෑම් කරන අතර ම ගෝලීයකරණය, තාක්ෂණය සහ සදාචාරාත්මක ප්‍රශ්න වැනි 21 වන සියවසේ අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපන පද්ධති පරිණාමය වීමට හැකියාව ලබාදෙයි.

විශේෂයෙන්, ප්‍රගතිශීලීවාදය, යථාර්ථවාදය, පරමාදර්ශවාදය සහ බෞද්ධ අධ්‍යාපන දර්ශනය වැනි දර්ශන මගින් සාකල්‍ය, වටිනාකම් මත පදනම් වූ අධ්‍යාපනයේ සංවර්ධනය පිළිබඳ විවිධාකාර නමුත් අනුපූරක අවබෝධයක් ලබා දෙයි. ඒවා දැනුමැති සමාජයක් පමණක් නොව සදාචාරාත්මකව වගකිවයුතු, චිත්තවේගීය වශයෙන් බුද්ධිමත් සහ සමාජීය වශයෙන් සවිඥානක ඉගෙන ගන්නන් පෝෂණය කිරීමට දායක වේ. මේ අනුව, පුද්ගල පරිවර්තනය සහ සමාජ සංවර්ධනය යන දෙකම පෝෂණය කරමින් අර්ථවත්, සහ අනාගතයට සූදානම් අධ්‍යාපන පද්ධති ගොඩනැගීම සඳහා අධ්‍යාපන දර්ශනය අත්‍යවශ්‍ය වන බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරල, දයාරෝහන. (1982). *අධ්‍යාපන රචනා.* කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

කුලරත්න, ඩබ්ලිව්.ජී. (2000). *අධ්‍යාපන සැලසුම්කරණය.* සාර ප්‍රකාශන මුද්‍රණය.

සිරි සෝමිස්සර හිමි, මාපලගම. (1965). *බෞද්ධ සංස්කෘතිය.* ඇම්.ඩී ගුණසේන සමාගම.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (1996). *ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යපන සම්ප්‍රදාය. සරණංකර සංඝරාජ හිමිගෙන් පසු යුගය.* පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයඃ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2002). *ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යපන සම්ප්‍රදාය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජාතික අධ්‍යාපන ආයතනය. (2009). *ශ්‍රී ලංකා අධ්‍යාපනයේ දශක හතරක විකාශය 1969, 2009,* පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව.

ඇකිරියගල. නන්ද හිමි. (2013). බෞද්ධ අධ්‍යාපනය හා සංකල්ප සාධනය, චරණ ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්ඃ විමලසිරි හිමි මැදවෙල. ධම්මසිරි හිමි තෙලුල්ලේ. විදුදය ප්‍රකාශන මධ්‍යස්ථානය.

පුංචි තක්ෂිලාව. (2010). "දරුවාගේ අධ්‍යාපනය සාර්ථක වන්නට නම්". *මහා මේඝ. මංගල කලාපය.* රත්මලානඃ මැලිබන් මිලක් ප්‍රඩක්ට්ස්. ප්‍රයිවට් ලිමිටඩ්.

සුගතවංශ හිමි, හතරබාගේ. (2014). "අධ්‍යාපනය සහ බෞද්ධ අධ්‍යාපනයේ ඉතිහාසයඃ හැඳින්වීමක්, *බෞද්ධ අධ්‍යාපන දර්ශන අධ්‍යයන.* සංස්ඃ හසන්ත වාසනා සමරසිංහ ආදිහු. මිරිහානඃ විහාරස්ථාන දායක සභාව.

Adhapana siyawasa prakashanaya (volume 1) (1967), Minstry of Eduction: govt. of Ceylon.

Brookfield, S. D. (1995). *Becoming a critically reflective teacher*. Jossey-Bass.

Dewey, J. (1938). *Experience and education*. Macmillan.

Freire, P. (1996). *Pedagogy of the oppressed* (Rev. ed.). Penguin Books.

Goleman, D. (1995). *Emotional intelligence*: Why it can matter more than IQ. Bantam Books.

Gunasekara, V. A. (2003). *The Buddhist attitude to education*. Buddhist Publication Society.

Knight, G. R. (2006). *Philosophy and education: An introduction in Christian perspective* (4th ed.). Andrews University Press.

Morris, V. C. (1966). *Existentialism in education: What it means*. Harper & Row

Noddings, N. (2012). *The ethics of care and education*. Teachers College Press.

Ozmon, H. A., & Craver, S. M. (2011). *Philosophical foundations of education* (9th ed.). Pearson Education'

Rahula, W. (1974). *The heritage of the bhikkhu: A short history of the bhikkhu in educational, cultural, social, and political life*. Grove Press.

Silva, L. (2008). *Buddhist education in Sri Lanka: A historical overview*. University of Peradeniya Press.

Sterling, S. (2001). *Sustainable education: Re-visioning learning and change*. Schumacher Briefings.